බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

එකතු කළ අගය මත බද්ද (VAT)

VAT ගෙවීම කරන මෙන් ද VAT වාර්තා ඉදිරිපත් කරන මෙන් ද කරනු ලබන සිහිපත් කිරීමයි.

1. VAT ගෙවීම් කිරීම

2026 සැප්තැම්බර් මාසය සඳහා VAT ගෙවීම් 2026 ඔක්තෝබර් 20 වන දින හෝ එදිනට පෙර සිදුකළ යුතුය.

බදු වර්ගය සඳහා කේතය සහ ගෙවීම් කාල කේතය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

බදු වර්ගය සඳහා කේතය	70
ගෙවීම් කාල කේතය	26330
ගෙවීම් වර්ගය	S

- චෙක්පතකින් හෝ බැංකු අණකරයකින් හෝ ගෙවීම් ඇණවුමකින් කරනු ලබන ගෙවීමක් නියමිත දිනය පසු වී උපලබ්ධි වීම ද ප්‍රමාද ගෙවීමක් ලෙස සළකනු ලැබේ.
- බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම සඳහා දණ්ඩන පනවනු ලබන බව කරුණාවෙන් සලකන්න.

2. VAT වාර්තා භාරදීම

පහත සඳහන් කාල සීමාව සඳහා VAT වාර්තා 2026 ඔක්තෝබර් 31 වන දින හෝ එදිනට පෙර එය මාර්ගගත ක්‍රමය මගින් භාරදිය යුතුය.

වාර්තා ගොනු කිරීම, කාලසීමාව සහ වාර්තා කාල කේත පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

වාර්තා ගොනු කිරීම	කාලසීමාව	කාල කේතය
මාසික	2026 සැප්තැම්බර් මාසය සඳහා	2633

- වාර්තාවක් ලබාදීමට අසමත් වීම මත හෝ වැරදි වාර්තාවක් ලබාදීම මත **දණ්ඩන පනවනු** ලැබේ.
- මීට අමතරව, එකතු කළ අගය මත බදු වාර්තාවක් ප්‍රමාද වී ගොනු කරනු ලබන අවස්ථාවක දේශීය මිලදී ගැනුම් මත හෝ ආනයන මත ඉල්ලා ඇති **යෙදවුම් බදු බැර අඩුකිරීමට පහත දක්වා ඇති පරිදි ඉඩ නොදිය යුතුය.**
    - දේශීය මිල දී ගැනීම් සඳහා නිකුත් කරන ලද බදු ඉන්වොයිස් මත ගෙවනු ලබන එකතුකළ අගය මත බද්ද, එම බදු ඉන්වොයිසිය නිකුත් කළ දින සිට මාස 12ක කාලයක් ඉකුත්වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක නිමැවුම් බද්දෙන් අඩුකර ගතයුතු අතර අදාළ බදු අය කළ හැකි කාලසීමාවට අදාළ එකතුකළ අගය මත බදු වාර්තාව එකී මාස 12 ඉකුත්වීමට පෙර ඉදිරිපත් කළ යුතුය.
    - ආනයනය මත ගෙවනු ලබන එකතුකළ අගය මත බද්ද, එම තීරුබදු ප්‍රකාශයේ සඳහන් වන දින සිට මාස 24ක කාලයක් ඉකුත්වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක නිමැවුම් බද්දෙන් අඩුකර ගතයුතු අතර අදාළ බදු අය කළ හැකි කාලසීමාවට අදාළ එකතුකළ අගය මත බදු වාර්තාව එකී මාස 24 ඉකුත්වීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්